# 5 ශ්‍රේණිය සිංහල
# ගුරු අත් පොතට
# වැඩ පොත - අංක 12

Part i

**L 10 S 10 R 10 W 10**

**නිපුණතා ආවරණය - 2021**

පිළිතුරු 3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය



- ප්‍රාණවාචී හෝ අප්‍රාණවාචී හෝ නාම පද යෙදෙන වාක්‍යයක ක්‍රියා පදය යෙදෙන ආකාරය සාකච්ඡා කරයි. ලියයි.
- ස්ත්‍රී ලිංග නාමපද හෝ පුරුෂ ලිංග නාමපද හෝ වාක්‍යයක භාවිත වන ආකාරය විස්තර කරයි. ලියයි.
- නාම පදයක ඒකවචන සහ බහුවචන භේදය ප්‍රකාශ කරයි. ලියයි.
- සරල වාක්‍යයක උක්තය, කර්මය සහ ක්‍රියාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. ලියයි.
- වාක්‍යයක යෙදෙන ආකාරය අනුව නාම පදයක උක්ත අනුක්ත භේදය ප්‍රකාශ කරයි. ලියයි.
- වර්තමාන කාල ප්‍රථම පුරුෂ හා උත්තම පුරුෂයට අදාළ ක්‍රියා පද භාවිතය ප්‍රකාශ කරයි. ලියයි.
- අතීත කාල ප්‍රථම පුරුෂයට හා උත්තම පුරුෂයට අදාළ ක්‍රියා පද ප්‍රකාශ කරයි. ලියයි.
- ද/ත්/යි/හා/සහ යන්න යොදා එකතුවන නාමපද කිහිපයක් උක්තය ලෙස යෙදුණු වාක්‍යවල නිවැරදි භාවිතය විස්තර කරයි. ලියයි.
- අක්ෂර වින්‍යාසයේ නිවැරදි භාවිතය පිළිබඳ සාකච්ඡා කරයි. ලියයි.

**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

**For Online Class Details – WhatsApp 071 9020298**

# 5 ශ්‍රේණිය මව්බස (සිංහල)

# $L_{10}$ $S_{10}$ $R_{10}$ $W_{10}$ ඉගෙනුම් පල

- ප්‍රාණවාචී හෝ අප්‍රාණවාචී හෝ නාම පද යෙදෙන වාක්‍යයක ක්‍රියා පදය යෙදෙන ආකාරය සාකච්ඡා කරයි. ලියයි.
- ස්ත්‍රී ලිංග නාමපද හෝ පුරුෂ ලිංග නාමපද හෝ වාක්‍යයක භාවිත වන ආකාරය විස්තර කරයි. ලියයි.
- නාම පදයක ඒකවචන සහ බහුවචන භේදය ප්‍රකාශ කරයි. ලියයි.
- සරල වාක්‍යයක උක්තය, කර්මය සහ ක්‍රියාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. ලියයි.
- වාක්‍යයක යෙදෙන ආකාරය අනුව නාම පදයක උක්ත අනුක්ත භේදය ප්‍රකාශ කරයි. ලියයි.
- වර්තමාන කාල ප්‍රථම පුරුෂ හා උත්තම පුරුෂයට අදාළ ක්‍රියා පද භාවිතය ප්‍රකාශ කරයි. ලියයි.
- අතීත කාල ප්‍රථම පුරුෂයට හා උත්තම පුරුෂයට අදාළ ක්‍රියා පද ප්‍රකාශ කරයි. ලියයි.
- ද/ත්/යි/හා/සහ යන්න යොදා එකතුවන නාමපද කිහිපයක් උක්තය ලෙස යෙදුණු වාක්‍යවල නිවැරදි භාවිතය විස්තර කරයි. ලියයි.
- අක්ෂර වින්‍යාසයේ නිවැරදි භාවිතය පිළිබඳ සාකච්ඡා කරයි. ලියයි.

## ලිඛිත භාෂාවෙන් ලියවුණු ලේඛන කියවීම

- පහත සඳහන් උද්ධෘත, සිසුන්ට තනි තනි ව ශබ්ද නගා කියවන්න. කියවීමේ දී නිවැරදි ව උච්චාරණය කරන්නේ දැයි අනෙක් සිසුන් නිරීක්ෂණය කරන්න. (මෙම නිපුණතාවට අදාළ ඉගෙනුම් පල සාධනයට යොදා ඇති ක්‍රියාකාරකම් සඳහා තෝරා ගත් කෘතිවලින් සරල ඡේද ඇතුළත් කර ඇත. එනමුත් එම කෘති පස් වන ශ්‍රේණිය සඳහා නිර්දිෂ්ට කෘති නොවන බව අවධානයට ගත යුතු ය.)

1. ". . . නිල්වන් කඳු වළල්ල නිසොල්මනේ පසු වෙයි. එකිනෙක උස් වූ කඳු වැටි එකිනෙකට පසුපසින් මතු වී හිස ඔසවා තැනිතලාවට මුහුණ ලා සිට ගනී. කඳු මත වූ විශාල ගල්තලාවන් මතින් ඇද හැලෙන රිදී රේඛා වැනි දිය ඇලි කඳුකරයේ අඳින ලද මෝස්තරයක් වැනි ය. කඳු පෙළ පාලනය කරන සෙන්පතියකු වැනි වාළිඹේ හෙළ කුඩා ළමයින් රැසක් වට කරගත් ගුරුවරයකු මෙන් ගෞරවාන්විත ව නැඟී සිටියි . . ."

   වනේ ඇඳුණු පිය සටහන් - පියසේන කහඳගමගේ

2. පුංචි මහත්මයා නම් හැබෑ ම කම්මැලියෙකි. මා ඉතා අමාරුවෙන් හේනට එක්ක ගිය හොත් ඔහු උදැල්ල දෙපාරක් බිම ගසා "අපොයි හති යි !" කියමින් ගලක් උඩ වාඩි වෙයි. අප උදැල්ලෙන් කොටා වල් පැළ උදුරන විට කුරුම්ඹියකු හෝ පණුවකු හෝ කැපී දඟලනු දකින පුංචි මහත්මයා "අපොයි පව් !'යි කියයි. ජින්නා කොළ රොඩු එක්කාසු කොට පුංචි මහත්මයාගේ ඇඟට දැමූ විට ඔහු නැඟී බැණබැණ ගොස් අනික් ගලක් උඩ වාඩි වෙයි.

   මඩොල් දූව - මාර්ටින් වික්‍රමසිංහ

3. හේන් අස්වනු නෙළාගත් පසු දෙවියන්ගේ කොටහ වෙන් කිරීමට ඔවුහු පුරුදු ව සිටිති. සමහරු දෙවියන්ගේ කොටහ අම්පාරේ පුල්ලෙයාර් කෝවිලට ගෙන ගොස් දෙති. හේනේ අස්වනු නෙළාගත් පසු ඒවා ආහාරයට ගැනීමට පෙර දෙවියන්ට හා කුරුලු කොබෙයියන්ට දානයක් දීමට ඔවුහු පුරුදු ව සිටිති. දානය සකස් කොට දෙවියන්ට හා කුරුලු කොබෙයියන්ට පිළිගැන්වීමෙන් පසු ඔවුහු ද භුක්ති විඳිති.

   වනේ ඇඳුණු පිය සටහන් - පියසේන කහඳගමගේ.

4. පොඩි හාමුදුරුවන්ගේ පැහැදිලි තියුණු කටහඬ පන්සල් වත්ත පුරා විහිද යයි. අකුරු ඉලක්කම් උගනීමට පැමිණි ගමේ ළමයි කිප දෙනෙක් වැලිපිල්ල අසල සිට ගෙන සිටිති. සරම් පමණක් හැදි මල්බින්දු, කළුවා සහ සරම් බැනියම් හැදි කිප දෙනෙක් ද ඔවුන් අතර වෙති.

අපූරු ගමේ පොඩි ඇත්තෝ - සෝමවීර සේනානායක

5. පාසල් වත්ත අද්දරින් ගලා බස්නා දිය කඳුරක් වෙයි. මේ දිය කඳුරට දිය බීමට මුවෝ පැමිණෙති. එතැන හැඳින්වෙන්නේ දියමංකඩ නමින් ය. මේ දියමංකඩ අසල හත් අට දෙනෙකුගෙන් යුත් මුව රංචුවක් වූහ. දිය බී ගොඩ වූ මුවෝ සැනසිල්ලේ ගිමන් හරින්නවුන් පරිද්දෙන් බලා සිටියහ. ඉඳහිට ඔවුහු නාද කරති.

වනගත චාරිකා - පියසේන කහඳගමගේ

6. එදා රාත්‍රියේ මල්බින්දු නින්දට ගියේ දැඩි කනස්සල්ලෙන් යුතු ව ය. පොඩි මැණිකාත් උක්කු මැණිකාත් ගෙතුළ කාමරයේ නිදති. කිරිනේලිස් ඉස්තෝප්පුවේ වැල් ඇඳෙහි නිදයි. මල් බින්දුත් සුරංගියාත් ඉස්තෝප්පු කාමරයේ බිම පැදුරු මත නිදති.

අපූරු ගමේ පොඩි ඇත්තෝ - සෝමවීර සේනානායක

7. මල්බින්දුගේ ගෙදර උදේ පාන්දරින් ම අවදි වන පොඩි මැණිකා, සුරංගියා සහ උක්කු මැණිකා අවදි කරවයි. බිම ඇතිරූ පැදුරු අකුළා දොර මුල්ලේ ගසා කොට්ටා ද පසෙක තබන ඔවුහු පාසල් යෑමට සූදානම් වෙති. කිරිනේලිස් හැඳ සිටින සරමට අමතර ව හිසේ සිට සරමක් පොරවා ගෙන කිරි දොවයි. මල්බින්දු හරකුන්ගේ සාත්තුව අරඹයි. මෙතෙක් කල් නිසි ලෙස දත් මැද මුහුණ නොසේදූ සුරංගියා සහ උක්කු මැණිකා ළිපේ දර අඟුරු කැබැල්ලක් පොල් කටුවක දමා කොටා කුඩු කර දත් මදිති. ඇතැම් විටක අඟුරු කොටනු ලබනුයේ ලුණු ස්වල්පයක් මිශ්‍ර කොට ය. අඟුරුත් ලුණුත් කටේ විෂබීජ ද මඩිමින් දත් සුදු කරයි. බෝඹු හෝ කරඳ හෝ කෝටුවක් තලා බුරුසුවක් සේ ගෙන දත් මැදීම සිදු කෙරෙයි. සුරංගියාගේ සහ උක්කු මැණිකාගේ දත් පිරිසිදුව දැන් පවුලට ම බලපා ඇත. ළිඳ ළඟට යන ඔවුහු දිය ඇද මුහුණ සෝදති. අත් පා පිරිසිදු කර ගනිති.

අපූරු ගමේ පොඩි ඇත්තෝ - සෝමවීර සේනානායක

7. මල්බින්දුගේ ගෙදර උදේ පාන්දරින් ම අවදි වන පොඩි මැණිකා, සුරංගියා සහ උක්කු මැණිකා අවදි කරවයි. බිම ඇතිරූ පැදුරු අකුළා දොර මුල්ලේ ගසා කොට්ටා ද පසෙක තබන ඔවුහු පාසල් යෑමට සූදානම් වෙති. කිරිනේලිස් හැඳ සිටින සරමට අමතර ව හිසේ සිට සරමක් පොරවා ගෙන කිරි දොවයි. මල්බින්දු හරකුන්ගේ සාත්තුව අරඹයි. මෙතෙක් කල් නිසි ලෙස දත් මැද මුහුණ නොසේදූ සුරංගියා සහ උක්කු මැණිකා ළිපේ දර අඟුරු කැබැල්ලක් පොල් කටුවක දමා කොටා කුඩු කර දත් මදිති. ඇතැම් විටක අඟුරු කොටනු ලබනුයේ ලුණු ස්වල්පයක් මිශ්‍ර කොට ය. අඟුරුත් ලුණුත් කටේ විෂබීජ ද මඩිමින් දත් සුදු කරයි. බෝඹු හෝ කරඳ හෝ කෝටුවක් තලා බුරුසුවක් සේ ගෙන දත් මැදීම සිදු කෙරෙයි. සුරංගියාගේ සහ උක්කු මැණිකාගේ දත් පිරිසිදුව දැන් පවුලට ම බලපා ඇත. ළිඳ ළඟට යන ඔවුහු දිය ඇද මුහුණ සෝදති. අත් පා පිරිසිදු කර ගනිති.

අපූරු ගමේ පොඩි ඇත්තෝ - සෝමවීර සේනානායක

8. දයාබර අප්පච්චි,

මම සනීපෙන් සිටිමි. . . .මම නැවතත් ඉගෙන ගනිමි. පොත්පත් පමණක් නොව වඩු වැඩත් උගනිමි . . . දෙවි පිහිටෙන් අම්මාට දැන් හොඳට ම සනීප යැයි සිතමි . . . අම්මාත් අක්කාත් මල්ලිලාත් නංගිලාත් මතක් කරමි. නවතිමි.

මීට
දයාබර
පුතා,
නිමල්

අඹ යහළුවෝ - ටී.බී.ඉලංගරත්න

9. ආදරණීය අම්මේ,

අපි කිසි කරදරයක් නැති ව සතුටින් සිටිමු. අපි පළමුවෙනි බඩු තොගය ගෙනාවෙමු. අද එක් තොගයකට වඩා ගෙනෙන්නට වෙලා තිබුණේ නැහැ . . .

මීට - ආදරවන්ත පුත්‍ර
පියදාස

රණරාළ - ජී. බී. සේනානායක

10. පාරේ මඩ වගුරු උඩින් බර කරත්තයක් ගමන් ගන්නා සේ බෙලෙක් හඬ මතු කරවමින් කැගසන බයිසිකලය මා ඔසවා ගෙන යා නොහැකි යැයි හඬ නගා පවසද්දී එය ගණන් නොගත් මම සුදු පුළුන් කනත්ත පසුකර රතුපහ ආසන්නයට පැමිණියෙමි. රතුපහ ගල් බොරලු සහිත රතු පසින් යුත් පෙදෙසක් බැවින් ගමන් කිරීම පහසු ය. මිටි කඳු බෑවුම් සහිත වූ එම පෙදෙසේ මම වේගයෙන් සයිකලය පදවමින් සිටියෙමි. හදිසියකට නවතා ගැනීමට තරම් සයිකලයේ තිරිංගය ශක්තිමත් නොවූව ද . . . වනයේ අවශ්‍යතාවකැයි මම නොසිතුවෙමි.

වනේ ඇඳුණු පිය සටහන් - පියසේන කහඳගමගේ

11. . . . මඩොල් දූව ගැන ගැමියන් කී කථා ඇසූ මා තුළ එහි යෑමට හටගත් ආසාව මැඩගෙන සිටියේ ඉතා අමාරුවෙනි. කිහිප දවසක් මම ජින්නා සමඟ මේ දූපත අසලට යාත්‍රා කළ නමුත් එහි නොබැස්සෙමි. මා කරන හැම කාරියකට ම අනුබල දෙන ජින්නා එහි බැසීමට මට අනුබල නුදුන්නේ ඔහු ගැමියන්ගේ කථා තරයේ ඇදහුවකු බැවිනි'යි සිතමි.

මඩොල් දූව - මාර්ටින් වික්‍රමසිංහ

12. දිනක් උදෑසන මුදලිත් ගමණ්ඩිත් පුංචි බණ්ඩයියාත් මමත් නා ඇල්ල බලා පිටත් වුණෙමු. බණ්ඩාරදූව කඳුරෙන් එතෙර වූ අපි අමංගල කඳුවැටිය අසලින් බොක්කෙබැද්ද දෙසට ගමන් කළෙමු. කඳු බෑවුමේ ගමන් කළ අපි කොටිතුත්තිරි විමානයක් පසු කොට දෙමට ගස්වලින් පිරුණු ලන්දකට පිවිසියෙමු.

වනේ ඇඳුණු පිය සටහන් - පියසේන කහඳගමගේ

12. දිනක් උදෑසන මුදලිත් ගමණ්ඩිත් පුංචි බණ්ඩයියාත් මමත් නා ඇල්ල බලා පිටත් වුණෙමු. බණ්ඩාරදූව කඳුරෙන් එතෙර වූ අපි අමංගල කඳුවැටිය අසලින් බොක්කෙබැද්ද දෙසට ගමන් කළෙමු. කඳු බෑවුමේ ගමන් කළ අපි කොටිතුත්තිරි විමානයක් පසු කොට දෙමට ගස්වලින් පිරුණු ලන්දකට පිවිසියෙමු.

වනේ ඇඳුණු පිය සටහන් - පියසේන කහඳගමගේ

13. . . . ගම අසලින් වන වැදුණු අපි වන මැද්දෙන් වැටී තිබුණු රෝද පාර ඔස්සේ ගමන් කළෙමු. දිය කඩිති කිහිපයකින් එතෙර වී ගමන් කළ අපට සාවුන්, මීමින්නන්, මුවන් වැනි වන සුරතලුන් මිස භයානක මෘගයින් හමු නොවුණි. මයිල තුනක් පමණ මඟ ගෙවූ අපි හේන් යායෙන් මතු වීමු.

හිරු රැස් මැකී ගොස් කැලය අඳුරින් වැසී යද්දී අපි බණ්ඩයියාගේ හේනට පැමිණියෙමු.

වනේ ඇඳුණු පිය සටහන් - පියසේන කහඳගමගේ

14. පාර දෙපස කුඹුරු පැසී තිබුණි. සුනිල් වෙලට නැමී වී කරලක් කඩා ගත්තේ ය. එයින් වී ඇටය බැගින් කඩා ගෙන දතින් පොතු ඇර කමින් ගියේ ය. අව් රැස් සැර නැති නිසා දෝ වී කුරුල්ලෝ දැන් ම ම ඒ මේ අත රංචු රංචු ඉගිලී ගියහ. ගිරවෙක් ද වී කරලක් ඩැහැගෙන වනාන්ත දෙසට පියඹා ගියේ ය. වෙල මැද සිටගත් පඹයාගේ හිස මත බෙලෙක් තොප්පිය ඉරු රැසින් දිලිසුණේ ය.

කුඹුරු යාය පසු කළ සුනිල් ගල් වළ අසලින් ගමන් කළේ ය.

අඹ යහළුවෝ - ටී. බී. ඉලංගරත්න

15. . . . අලියාට මිනිස් ඉව දැනීමට වැඩි වේලාවක් ගත නොවුණි. පැල වෙත පැමිණි ඌ පොතු ආවරණය කඩමින් මිනිසා හොඬයට ගැනීමට තැත් කළේ ය. ගමණ්ඩි පැල් මැස්සේ මුල්ලකට වී ගුළි ගැසුණේ ය. කෝප වූ අලියා පැල කඩන්නට පටන් ගත්තේ ය. ගස් පොතු ආවරණය කඩමින් අනෙක් පැත්තෙන් බිමට පැනගත් ගමණ්ඩි හිස හැරුණු අත දිව ගියේ ය. ගස උඩ තැනූ පැල සොයා ගැනීමට ඔහුට සිහිය නැති විය. ඔහු වෙනත් ගසකට බඩ ගා ගත්තේ ය. අලියා ගස මුලට පැමිණ ඝෝර නාද පැවැත්වී ය. ඌ හඬ තලමින් ගස පෙරළීමට තැත් කළේ ය.

වනේ ඇඳුණු පිය සටහන් - පියසේන කහඳගමගේ

16. නිවසට පා තබන විට ම රුවන්ගේ මවත් පියාත් සොයුරියත් ඉදිරියට පැමිණ අමුත්තන් පිළිගත්හ.

"අප්පච්චි, මේ තමයි මගේ යාළුවෝ දෙන්නා"යි ඔහු මිතුරන් දෙදෙනා සිය පියාට හඳුන්වා දුන්නේ ය.

"වාඩි වෙන්න ළමයිනේ" රුවන්ගේ අම්මා අප්පච්චිට පෙර කතා කළා ය.

රුවන්ගේ අක්කා මලී දොර රෙද්ද ඈත් කොට උළුවස්සට හේත්තු වී බලා සිටියා ය.

"දැන් ඉතින් තේ එකක් එහෙම බීලා, ඇඳුම් මාරු කරලා, මහන්සි අරින්න"යි කියමින් රුවන්ගේ අම්මා තේ බන්දේසිය ඇල්ලුවා ය.

තුන් යහළු විභ්‍රමය - කුලසේන ෆොන්සේකා

17. සඳුදා උදෑසන සුනිල් හා මෛත්‍රීත් අප්පච්චිගේ කාරයේ නැඟී පාසල් ගියහ. මඳක් දුර යන විට සුනිල් නිමල් දුටුවේ ය. කාකි කමිසයත්, නිල් කමිසයත්, දුඹුරු කැන්වස් සපත්තුත් ඇඳ ගත් ඔහු පොත් ගොඩ දෑතින් ගෙන දෑතට හිර කර ගෙන ඉක්මන් පයින් ගියේ ය.

"අප්පච්චි අර ළමයත් දාගෙන යමු" අප්පච්චි කාරය නැවැත්වූයේ ය.

"නිමල්" සුනිල් හඬ ගෑවේ ය.

නිමල් ගල් ගැසුණාක් මෙන් පාර අද්දර සිට ගෙන බැලුවේ ය.

අඹ යහළුවෝ - ටී. බී. ඉලංගරත්න

18. අමිතා ලිපිය කියවද්දී කීප වතාවක් නැවැත්වූවා ය. කඳුළු පිස ගත්තා ය. රන්මැණිකා ද කීප විටක් ම ඇසෙන්නට ම ඉකි බින්දා ය. ලියමන කියවා අවසාන වූ පසු මුතු බණ්ඩා කඳුළු පිරුණු නෙත් ඇති ව හඬ නගා සිනා සී "පින් පව් දෙක තමයි" කීවේ ය.

කුඩා මල්ලිලාත්, නංගිලාත් "අයියාගෙන් ලියමනක්, අයියාගෙන් ලියමනක්" තාලයට කියමින් අත්පුඩි ගැසූහ.

එදා සවස ම මුතු බණ්ඩා උත්තරයක් ලිවුවේ ය. රන්මැණිකා පුංචි දුවට කිරි දෙමින් එතැන වාඩි වී සිටියා ය. ඇයට දැන් බොහෝ දුරට සනීප යි. අමිතා තාත්තා කී ලෙසට ලියමන ලීවා ය.

අඹ යහළුවෝ - ටී. බී. ඉලංගරත්න

19. අලුත් වලව්වේ බඩු පටවා ගත් ලොරි දෙක පාන්දර ම පිටත් ව ගියේ ය. එක් ලොරියක ගල් බණ්ඩා ගියේ ය. ඔහු ගියේ බඩු පරෙස්සම් කර ගැනීමටත් අලුත් තැන බලා ගන්නටත් ය. පළිඟු මැණිකාත්, සිසිලියාත්, නීලා බල්ලාත් අනික් ලොරියේ නැඟී ගියහ. සුනිල් ද ලොරියකින් යාමට අවසර ඉල්ලුවේ ය. ඒ ඉල්ලීම අත්තම්මාගේ එක රැවුමකින් ම නිෂ්ප්‍රභ විය.

අඹ යහළුවෝ - ටී. බී. ඉලංගරත්න

20. පිරිස පාරට ගියෝ ය. රන්මැණිකාත් ඇගේ දුව අමිතාත් පසෙකට වී සිටියෝ ය. අප්පච්චි කාරය පඩි පාමුලට ගෙනාවේ ය. සුනිල් ඉස්සරහ ආසනයේ වාඩි වූයේ ය. අත්තම්මාත් අම්මාත් මෛත්‍රීත් පස්සා ආසනයට නැංගෝ ය.

අඹ යහළුවෝ - ටී. බී. ඉලංගරත්න

## නාම පද

- යම් කිසි ද්‍රව්‍යයක්, පුද්ගලයෙකු, ස්ථානයක්, සතෙකු හැඳින්වීම සඳහා නාම පද භාවිත කරයි. ඒ අනුව දී ඇති වගු සුදුසු පරිදි සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ත්ව නාම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

| නාම පදය | ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ත්ව නාම |
|---|---|---|---|---|
| පෑන | √ | | | |
| නංගී | | | | |
| පූසා | | | | |
| සරුංගලය | | | | |
| සීගිරිය | | | | |
| අලියා | | | | |
| පිට්ටනිය | | | | |
| සමන් | | | | |
| පොලීසිය | | | | |
| ගුරුතුමිය | | | | |

- ඡේදයේ සඳහන් නාම පද තෝරා ගෙන වගුව සම්පූර්ණ කරන්න.

**සිරිමත්**

සිරිමත් උදෑසනින් ම අවදි විය. කුරුල්ලන්ගේ මිහිරි නාදය මිහිරි ගීතයක් සේ ඔහුට හැඟුණි. ඔහු විගස මුහුණ සෝදා කියවීම් පොත රැගෙන කියවන්නට පටන් ගත්තේ ය. පූසාත් බල්ලාත් පොත් මේසය යට ගුළි ගැසී නිදා සිටිති.

"අපේ පුතා කොච්චර හොඳ ද ? උදෙන් ම නැගිටලා පාඩම් වැඩ" අම්මා තාත්තාට කියනු මට ඇසිණි.

"ඔය කේතලය පොඩ්ඩකට මෙහාට දෙන්න. මම වතුර එකක් ළිපේ තියන්නම්" යැයි තාත්තා කිවුවේ ය.

කියවීම් පොත කියවීමෙන් අනතුරු ව චිත්‍ර පොතත්, පාට පෙට්ටියත්, පැන්සලත් ගෙන "හිමිදිරියේ අසිරිය" පිළිබඳ ව චිත්‍රයක් ඇන්දෙමි. ඒ වන විට ඔරලෝසුවේ වේලාව 7.00 සටහන් වී තිබුණි.

"පුතා, මම අද මහරගම සීයලාගේ ගෙදර ගිහින් එන්න යනවා. මගෙ පුතා හොඳ ළමයා වගේ පාඩම් වැඩ ඉවර කරලා, සෙල්ලම් කරලා පරිස්සමට ඉන්න ඕනෑ" යැයි තාත්තා කිවුවේ ය.

කොට්ටාවේ ඇති අපේ නිවසේ සිට පන්නිපිටිය පසු කළ විට මහරගම නගරය හමු වේ.

"හොඳයි තාත්තා. තාත්තාත් පරිස්සමට ගිහිං එන්න" යැයි සිරිමත් පැවසුවේ ය.

| ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ත්ව නාම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

## <u>ප්‍රාණවාචී සහ අප්‍රාණවාචී නාම පද</u>

- පණ ඇති නාම පද ප්‍රාණවාචී නාම පද ලෙසත් පණ ඇති නාම පද අප්‍රාණවාචී නාම පද ලෙසත් හඳුන්වයි. ඡේද වල සඳහන් නාම පද තෝරා ගෙන දී ඇති වගු සම්පූර්ණ කරන්න.

පසිඳු සැම සෙනසුරාදා දිනයක ම සවස නිවස අසල ඇති පිට්ටනියට යයි. ඒ පිට්ටනිය වටා අඹ, පේර, ජම්බු, රඹුටන් ගස් ඇත. ඒවා පිට්ටනිය වටා ඇති ආරක්ෂිත පවුරක් සේ පෙනෙයි. කුරුල්ලන්, වඳුරන්, ලේනුන් ඒ පලතුරු ගස්වල නිරන්තරයෙන් ම සිටිනුයේ ඉදුණු අඹ, පේර, ජම්බු, රඹුටන් කෑමට ය.

සවස තුන පමණ වන විට අරිත, උතුළ, මාලික් සහ ආදවන් ද පිට්ටනියට එති. සියලු දෙනා ම සමගියෙන් ඔට්ටු සෙල්ලම් කරති. බට්ටා පනිති. ක්‍රිකට් ගසති.

විටෙක ඇඹුල් පේර ගස්වල ඇති ගෙඩි කඩා සියලු දෙනා ම ඒවායේ රස බලති.

අනතුරු ව අරිත රැගෙන එන බෝලය සහ පිත්ත ගෙන ක්‍රිකට් සෙල්ලම් කරති. උතුළ ගැසූ බෝල පහරක් අසල තිබූ කණුවක වැදුණි. කණුව අසල සිටි හා පැටියෙක් බිය වී කැලය දෙසට දිව ගියේ ය.

මේ අතර මාලික්ගේ නංගී බෝනික්කෙකු සහ ආදවන්ගේ අක්කා බෑගයක් අතැති ව පිට්ටනියට පැමිණියහ.

"මොනව ද අක්කේ ඔය බෑග් එකේ තියෙන්නේ" යැයි ආදවන් ඇසුවේ ය.

"ආ . . . කන්න. අපි අඹ අච්චාරුවක් හදාගෙන ආවා" යැයි බෑගයෙන් එළියට ගත් අඹ අච්චාරුව අක්කා ආදවන්ට දුන්නා ය.

"අක්කා හරි ම හොඳයි. එන්න අපි හැමෝ ම අඹ අච්චාරු කමු" යැයි ආදවන් යෝජනා කළේ ය.

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

කාව්‍යා සෑම සති අන්තයක ම සිය මවත් පියාත් සමඟ ඔවුන්ගේ ගොවිපළට යති. ගොවිපළට යන පාර දෙපස විවිධ වර්ගයේ මල් වර්ග වගා කර ඇත. මල්වල පැණි බීමට එන සමනලයන් සහ මීමැස්සන් පාර දෙපස සිටින්නේ කාව්‍යාත් ඇගේ මවත් පියාත් පිළිගැනීමට මෙනි.

තාත්තා උදැල්ලත් රැගෙන ගිය අතර අම්මා අත පිහියක් සහ යකඩ ඉත්තක් තිබිණි. නිවසින් පිටත් වන විට ම අම්මා වැලිතලප සහ තේ දැමූ උණුසුම් බෝතලයක් මා අතට දුන්නා ය.

ගොවිපළට ගිය කාව්‍යා වල් පැළ ගැලවූවා ය. තාත්තා පාත්ති සකස් කළේ ය. අම්මා ළපටි දඹල කඩා ගත්තේ "දඹල සම්බෝලයක් සෑදීමට කදිමයි" යැයි පවසමිනි.

ටික වේලාවකින් එතනට පැමිණි සරත් මාමා තාත්තාට බණ්ඩක්කා ඇට පැකට්ටුවක් ලබා දුන්නේ "මල්ලී මම මේවා ගන්නෝරුවේ කෘෂි උද්‍යානයෙන් ගෙනාවේ" යැයි කියමිනි. පසු ව සරත් මාමා ද තාත්තාට උදවු කළේ ය.

"මමත් ගිය මාසේ කරවිල, පතෝල, වැටකොළු පාත්ති වගයක් දැම්මා. ඌරන්ගෙන් තමයි පරිස්සම් කර ගන්න ඕනෑ. අපි හොඳ වැටක් ගැහුවා. අපේ පුතා ඒකට මට ගොඩක් උදවු කළා" යැයි සරත් මාමා පැවසී ය.

"අයියේ එන්න අපි තේ බීලා ඉඳිමු" යැයි යෝජනා කළ අම්මා අපට වැලිතලප දුන්නා ය. වැලිතලප දමා තිබූ බන්දේසිය පැත්තකින් තැබූ අම්මා "දුවේ තාත්තාටයි මේ මාමාටයි කෝප්ප දෙකක් දෙන්න" යැයි පැවසුවා ය.

අපි සියලු දෙනා ම ගොවිපළට වී වැලිතලප කා තේ බිවුවෙමු.

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

- කවියේ සඳහන් නාම පද තෝරා ගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

සරුංගලේ සරුංගලේ අයියෙ මටත් සරුංගලය
ඉහළ අහසෙ පාවෙනවා ඉහළ අහසෙ පා කරන්න
ගුවන් යානයක් වාගේ ටිකක් විතර දෙන්න බැරි ද
ඉහළට ඉහළට යනවා නංගි අසනවා

මල්ලී ඒ දැක සතුටින් ඉහළ අහසෙ පියා සලන
නූල පරිස්සමින් අරන් කුරුල්ලෙක් ද සරුංගලය
සුළඟ සමඟ පොරබදිමින් ඉහළට ඉහළට යන විට
සරුංගලය උඩ යවනවා සතුට දැනෙනවා

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|
| | |
| | |
| | |

- කවියේ සඳහන් පහත ප්‍රාණවාචී නාම පද සහ අප්‍රාණවාචී නාම පද යොදා වාක්‍ය සකස් කර ලියන්න. (ගුවන් යානය, සරුංගලය, නංගී, මල්ලී, කුරුල්ලෝ)

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

# පුරුෂ ලිංග නාම පද හා ස්ත්‍රී ලිංග නාම පද

- පළමු වන, දෙවන, තුන් වන සහ හතර වන ශ්‍රේණිවල දී ඉගෙන ගත් පුරුෂ ලිංග නාම පද හා ස්ත්‍රී ලිංග නාම පද මතකයට නංවන්න. පුරුෂ ලිංග නාම පදයට අදාළ ස්ත්‍රී ලිංග නාම පදයත්, ස්ත්‍රී ලිංග නාම පදයට අදාළ පුරුෂ ලිංග නාම පදයත් ලියන්න.

1 අම්මා - . . . . . . . . . . . .

2 ආච්චි - . . . . . . . . . . . .

3 . . . . . . . . . . . . - මල්ලි

4 . . . . . . . . . . . . - කිරිල්ලී

5 . . . . . . . . . . . . - දුව

6 ගිරවා - . . . . . . . . . . . .

7 . . . . . . . . . . . . - කිකිළි

8 රජ - . . . . . . . . . . . .

9 . . . . . . . . . . . . - වෛද්‍යවරිය

10 ශිෂ්‍යයා - . . . . . . . . . . . .

11 . . . . . . . . . . . . - ගුරුතුමිය

12 විදුහල්පතිතුමා - . . . . . . . . . . . .

13 . . . . . . . . . . . . - මුවදෙන

14 මිතුරා - . . . . . . . . . . . .

15 සිංහයා - . . . . . . . . . . . .

16 . . . . . . . . . . . . - යෙහෙළිය

17 නළුවා - . . . . . . . . . . . .

18 . . . . . . . . . . . . - ඇතින්න

19 කොටියා - . . . . . . . . . . . .

20 සහෝදරයා - . . . . . . . . . . . .

- ඡේදයේ සඳහන් නාම පද තෝරා ගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

විශේෂාංග කිහිපයකින් අනතුරු ව යෙදුණේ ත්‍යාග සහ සහතික පත් බෙදා දීමේ අවස්ථාව යි. ප්‍රථමයෙන් ම විද්‍යාලයේ ලේඛන කුසලතා දැක්වූ සිසු සිසුවියන්ට ත්‍යාග සහ සහතික පත් බෙදා දීම සිදු විණි.

ප්‍රාථමික අංශයේ දක්ෂතම ලේඛකයා වූයේ පස් වන ශ්‍රේණියේ උතුල දම්සර යි. දක්ෂතම ලේඛිකාව වූයේ එම ශ්‍රේණියේ ම උදාරි ප්‍රාර්ථනා ශිෂ්‍යාව යි.

තිසරු පබසර දක්ෂතම කවියාට හිමි සහතිකය ලබා ගත් අතර, සයුරංගි තක්ෂිලා දක්ෂතම කිවිඳියට හිමි සහතිකය ලබා ගත්තා ය.

නාට්‍ය තරගවලින් ප්‍රථම ස්ථානය ලැබුවේ මගේ පන්තියේ සිසුන් රඟ දැක්වූ 'උත්සාහයෙන් ජය ලැබුවෝ' නාට්‍යය යි. එම නාට්‍යයේ ප්‍රධාන චරිත වන්නේ ගමේ ජීවත් වුණු ගොවියෙකු සහ ගෙවිලියකි. ගොවියා ඉතා ම අලස තැනැත්තෙකි. ඔහු තුළ දියුණු වීමට කිසිදු උත්සාහයක් නොමැත. එහෙත් ගෙවිලිය ඉතා ම කඩිසර ය. දිරිමත් ය. ඇය තම කුඩා දරුවා සහ දැරිය රැගෙන උදෑසනින් ම ගොවිබිමට යයි. ඇයගේ උනන්දුව සහ කැපවීම නිසා අවසානයේ දී ගොවියා ද කාර්යශූර අයෙකු බවට පත් වූ ආකාරය එම නාට්‍යයේ තේමාව විය.

| පුරුෂ ලිංග නාම පද | ස්ත්‍රී ලිංග නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

- කවිවල සඳහන් නාම පද තෝරා ගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

1. බොහෝ පොත් කියවීමයි
දැනුම රැස් කර ලීමයි
පොත්පත් ලිවීමයි
ලේඛකයගේ විලස යි

2. බොහෝ පොත් කියවීමයි
දැනුම රැස් කර ලීමයි
පොත්පත් ලිවීමයි
ලේඛිකාවගෙ විලසයි

3. එන අදහස් සිතට
මනරම් ව ගොනු කරනට
හපනෙක් ය අපහට
කවියා ය ඒ සැම විට

4. වචන පෙළ හැඩ කරවා
අදහස යසට ගළපා
කවි ගීත ලියනා
කිවිඳියයි නම කියනා

5. උදෑසනින් කුඹුරට යන
උදැල්ලක් ද කරේ තියන
කම්මැළි නැති ගමනින් යන
ගොවියා වේ බත සපයන

6. උදෑසනින් අවදි වෙලා
ඇඹුලට කිරිබත් උයලා
නියර දිගේ පාද තබා
යන ගෙවිලිය හරි ම හොඳා

7. දෙමව්පියන් පා වැඳලා
ගුරුන්ගෙ බස් හොඳට අසා
ඉගෙන ගනියි මදහස පා
ඔහු වෙයි ලෝකෙ ම දිනනා

8. සමඟි ව එකමුතු ව සිටින
අන් අයහට උදවු කරන
ආදරයෙන් කතා කරන
ඇය වෙයි ලෝකය ම දිනන

9. පුංචි මමත් මලක් වගෙයි
සැමදා සුවඳ යි අනගි යි
සැම දෙනාගෙ ආදරය යි
ඒ දරුවා මම ම තමයි

10. පුංචි රෝස මලක් සේ ම
සුවඳ විහිදුවා දසත ම
ලොව සුවඳින් සැම දිනක ම
තබන දැරිය මම යි කදිම

| පුරුෂ ලිංග නාම පද | ස්ත්‍රී ලිංග නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

- නිවැරදි පිළිතුර තෝරා හිස්තැනෙහි ලියන්න. (ඇය, ඔහු, දරුවා, දැරිය, ලේඛකයා, ලේඛිකාව, ගොවියා, ගෙවිලිය, කවියා, කිවිඳිය)

1. බොහෝ පොත් සංඛ්‍යාවක් ලියූ . . . . . . . . . ට හිමි ත්‍යාගය දිනා ගත්තේ උතුළ දම්සර යි.
2. වන අසිරිය කවි පෙළ ලියූ . . . . . . . . වන්නේ කවිඳු ය.
3. දිනපතා පුවත්පතට ලිපි ලිවීම . . . . . . . . . . . පුරුද්දක් කර ගත්තා ය.
4. කාව්‍යා නෙත්මි, . . . . . . . . . . . . . ගේ කවිය ඉතා මනරම් යැයි මට සිතුණි.
5. දින පතා පාසල් යැම . . . . . . . . . ගේ ස්වභාවය වුවේ ය.

6. ". . . . . . . . . . . . . ඔබ ඉක්මන් කර පැමිණෙන්න" යැයි මව පැවසුවා ය.

7. කුඹුරේ නියර බැඳීමට . . . . . . . . . . . උදෑසනින් ම නිවසින් පිටත් වූවේ ය.

8 තිසරි විහංගා . . . . . . . . . . පාසලේ ජනප්‍රිය ම ක්‍රීඩිකාවක් වූවා ය.

9. කුඹුරට ඇඹුල රැගෙන යෑම . . . . . . . . . . . ගේ සිරිතකි.

10. . . . . . . . . . . . . . . . ගුරුවරුන්ට කීකරු දැරියක් වූවා ය.

## ඒකවචන නාම පද හා බහුවචන නාම පද

- පළමු වන, දෙවන, තුන් වන සහ හතර වන ශ්‍රේණිවල දී ඉගෙන ගත් ඒකවචන හා බහුවචන නාම පද මතකයට නංවන්න. ඒකවචන නාම පදයට අදාළ බහුවචන නාම පදයත්, බහුවචන නාම පදයට අදාළ ඒකවචන නාම පදයත් ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1 ගස | - . . . . . . . . . . . . | 11 . . . . . . . . . . . . | - පොත් |
| 2 කුරුල්ලා | - . . . . . . . . . . . . | 12 කුඹුර | - . . . . . . . . . . . . |
| 3 . . . . . . . . . . . . | - මල් | 13 . . . . . . . . . . . . | - කණ්ඩායම් |
| 4 . . . . . . . . . . . . | - උදලු | 14 ළමයා | - . . . . . . . . . . . . |
| 5 . . . . . . . . . . . . | - ගල් | 15 ශිෂ්‍යයා | - . . . . . . . . . . . . |
| 6 ගොවියා | - . . . . . . . . . . . . | 16 . . . . . . . . . . . . | - අපි |
| 7 . . . . . . . . . . . . | - අම්මලා | 17 ගුරුවරයා | - . . . . . . . . . . . . |
| 8 බල්ලා | - . . . . . . . . . . . . | 18 . . . . . . . . . . . . | - රටවල් |
| 9 . . . . . . . . . . . . | - තාත්තලා | 19 ලේඛකයා | - . . . . . . . . . . . . |
| 10 ගවයා | - . . . . . . . . . . . . | 20 පේළිය | - . . . . . . . . . . . . |

- ඡේදයේ සඳහන් නාම පද තෝරා ගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

කාලයක සිට බලාපොරොත්තු ව සිටි ගමනක් යෑමට පබෝධාට අවස්ථාව උදා විය. ඒ මුහුදු වෙරළට යෑමට ය. ඇය නියමිත දිනයේ සැමට පළමු ව අවදි ව ගමනට සූදානම් වූවා ය.

"අම්මේ, මගේ එක සපත්තුවයි තියෙන්නේ. කෝ අනික් සපත්තුව" පබෝධාගේ අයියා ජනිත් සිය මවගෙන් විමසුවේ ය.

"පුතා සපත්තු තියෙන්නේ ඉස්සරහ රාක්කයේ නේ. අනික් සපත්තුවත් එතන ඇති. ගිහින් බලන්න" අම්මා පිළිතුරු දුන්නා ය.

"අම්මේ, අපිත් එක්ක කුමාරි නැන්දායි මනීෂා අක්කායි යනවා නේ ද ?"

"ඔව් දුවේ, මට දැන් මතක් වුණේ. මම හදපු කඩදාසි මල් ටික මේසය උඩ ඇති. ඒකෙන් රතුපාට මල් පොකුරයි කහපාට මල් පොකුරු තුනයි පරිස්සමින් අරගන්න. ඒක මතක් කරල කුමාරි නැන්දට දෙන්න" අම්මා කිවුවා ය.

මෙතෙක් නිහඬ ව සිටි තාත්තාගේ කටහඬ අවදි විය. "පුතා . . . ඔයාගේ කාමරය ඇතුළේ පොත් පාර්සලයක් ඇති. ඒ පොත් පාර්සලය මනීෂා අක්කාට දෙන්න ඕනෑ; ඒක ගන්න. අනික් කාමර දෙකෙන් එකක මගේ කණ්ණාඩි කුට්ටමත් ඇති; ඒකත් අරගෙන ම එන්න" තාත්තා අයියාට පැවසුවේ ය.

"අම්මේ . . . එන්න. අපි මිදුලේ ඉන්නේ" යැයි මම පැවසුවෙමි.

"මම කාමරයේ දොරයි, ඉස්සරහ දොරවල් දෙකයි වහගෙන ම එන්නම්. පුතාලා වාහනයට නගින්න."අම්මා පැවසුවා ය.

අතරමග දී කුමාරි නැන්දා සහ මනීෂා අක්කා ද ගමනට එකතු වූහ. සියල්ලන් ම මුහුදු වෙරළට යන විට සවස හතර පමණ විය.

"අද නංගිට හරි ම සතුටු යි. කවදා ඉඳන් ද එන්න සූදානම. මටත් හරියට ඕනෑකම තිබුණා, දුව එක්ක ගෙන එන්න." අම්මා මනීෂා අක්කාට කිවුවා ය.

"අන්න අයියේ ලොකු නැවක්. අර බලන්න. අර බලන්න" පබෝධා උඩ පනිමින් කෑගැසුවා ය.

"ඔව් නංගි. එතන තියෙන්නේ එක නැව යි. අර බලන්න. අර ඈත නැව් දෙකක් ම එනවා." ජනිත් අයියා පබෝධාට නැව් දෙකක් පෙන්වී ය.

| ඒකවචන නාම පද | බහුවචන නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

- කවිවල සඳහන් නාම පද තෝරා ගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

1. ගමනක් ගොස් ආ විටක දී
සපත්තු නිසි තැන තියන්න
නිවස පුරා විසි නොකරන
පිළිවෙළ ඔබ පුරුදු වන්න

2. එක තැන එක සපත්තුව යි
තවත් තැනක අනික් එක යි
එවන් පුරුදු හරි ම කැත යි
පිළිවෙළකට තැබුම හොඳ යි

3. පුංචි මගේ කාමරය යි
පිරිසිදුයි පිළිවෙළ යි
අතු ගා පිරිසිදුවට නිසි
තැබුමට මම හරි කැමතියි

4. නිවසේ ඇති කාමර
පිරිසිදු ලෙස තබනට
ජනෙල් පියන් පත් හැර
තැබිය හැකි යි අප හට

5. මගේ මල් වත්තේ
රෝස ගස් බොහො ඇත්තේ
රෝස ගස් අස්සේ
රෝස මල් පොකුරක් ම ඇත්තේ

6. රෝස මල් පොකුරු
දැක මගේ සිත පිබිදූ
නොයෙක් පැහැ ගැන්වූ
සිතට මිහිරක් එක් වූ

7. මගේ කුඩා නිවසේ
යන තැන දොරක් වූයේ
ජනේල ද ඇන්දේ
නිවසෙ සිතුවම හරි අගෙයි නේ

8. ඇතුළෙ කාමරවල
දොරවල් දමා කඳිමට
වහලය ද සරි කොට
නිවසෙ සිතුවම කළා අවසන

9. මුහුදේ යන නැව
දෙස බලමින් අප
යන මෙන් ලොව වට
එයට නැංගා අප

10. යන අතරෙදි නැව
මුහුදේ තව තව
බොහෝ නැව් ඇති බව
දුටුවා අප සැම

| ඒකවචන නාම පද | බහුවචන නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

- දී ඇති නාම පදය අයත් වර්ගය ඉදිරියෙන් √ ලකුණ යොදා වගුව සම්පූර්ණ කරන්න.

| නාම පදය | ඒකවචන නාම පද | බහුවචන නාම පද | ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|---|---|---|
| පැන | √ | | | √ |
| ළමයි | | | | |
| නංගී | | | | |
| පන්සල් | | | | |
| සිසුහු | | | | |
| පූසා | | | | |
| ගොවීහු | | | | |
| සරුංගලය | | | | |
| සීගිරිය | | | | |
| අලියා | | | | |
| කොඩිය | | | | |
| බංකුව | | | | |
| පිට්ටනිය | | | | |
| කමිසය | | | | |
| සමන් | | | | |
| පොලිසිය | | | | |
| පන්සල | | | | |
| ලේන්නු | | | | |
| කුඩය | | | | |
| පැළය | | | | |
| මාමා | | | | |
| අශ්වයෝ | | | | |
| වෙළෙන්දෝ | | | | |
| ගුරුතුමිය | | | | |
| කඩදාසිය | | | | |
| වඳුරා | | | | |
| දෙමව්පියෝ | | | | |
| සොරු | | | | |
| මාළුවා | | | | |
| කොඩි | | | | |
| කුඩ | | | | |
| තාත්තා | | | | |
| තොටුපොළ | | | | |
| අශ්වයා | | | | |
| පැන්සල් | | | | |
| පාසල | | | | |
| බංකු | | | | |
| වලස්සු | | | | |
| පැළ | | | | |